**ශීර්ෂය 182 - විදේශ රැකියා අමාත්‍යාංශය**

**------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

විදේශ රැකියා අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ රැකියා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව, අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට විදේශ රැකියා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කල නොහැකි විය.

(ආ) විදේශ රැකියා අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි ඇතුලත් රු. 443,209,027 ක ඍණ අග්‍රිම ශේෂය අග්‍රිම ගැලපුම් ගිණුම මගින් සසඳා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි දැක්වෙන වර්ෂ අවසාන අග්‍රිම ශේෂය සහ අග්‍රිම ගිණුමෙහි ශේෂය අතර වෙනස 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7 (VI) ප්‍රකාරව අග්‍රිම ගැලපුම් ගිණුම මගින් සසඳා ඉදිරිපත් කළ යුතු වීම. | චක්‍රලේඛය අනුව අග්‍රිම ගැලපුම් ගිණුමට ආකෘතියක් දක්වා නොමැති බැවින් එම ගිණුම සකස් නොකළ බව ඉදිරි වර්ෂවලදී මූල්‍ය ප්‍රකාශන සමග අග්‍රිම ගැලපුම් ගිණුම ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. |

### 1.6.2 ආදායම් නොවන ලැබීම්

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අත්තිකාරම් 'බී' ගිණුමෙහි අමාත්‍යාංශයේ ලැබීම් යටතේ ඇතුළත් රු. 3,193,431 ක් වෙනත් ලැබීම් යටතේද ඇතුළත් වී තිබුණු අතර එම වටිනාකමින් ආදායම් නොවන ලැබීම් බහුගණනය වී තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල ගනුදෙනු නිවැරැදිව සටහන් කිරීම කෙරෙහි කළමනාකරණ අවධානය යොමු විය යුතුය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නැවත මෙවැනි වැරැදි සිදු නොවීමට අවශ්‍ය කටයුතු කරන බව. |

### 1.6.3 පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයයන් 5 කට අදාලව මාසික ගිණුම් සාරාංශ අනුව වියදම්වල එකතුව හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල දක්වා ඇති ශේෂයන් අතර එකතුව රු. 945,836 ක වෙනසක් නිරීක්ෂණය විය. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එක් එක් වැය විෂයයන්ට අදාල වියදම් ශේෂයන්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සසඳා අවශ්‍ය ගැලපීම් කළ යුතුය | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නැවත මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව. |

### 1.6.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අභ්‍යන්තර විගණන ඒකකයෙ පවතින පුරප්පාඩු හේතුවෙන අභ්‍යන්තර විගණනය මගින් පාලන පද්ධති පිළිබඳ ඇගයීමක් කළ නොහැකි වීම සහ එම ඒකකය ශක්තිමත් කිරීම තුලින් අභ්‍යන්තර පාලන පද්ධතිය සඵලදායීව පවත්වාගෙන යාමට කටයුතු කරන බව. |
| **(ii)** අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරික්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අභ්‍යන්තර විගණන ඒකකයෙහි පවතින පුරප්පාඩු පිරවීමට සහ එම ඒකකය ශක්තිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම (රු.)** | **අනුකූල නොවීම** | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ** මුදල් රෙගුලාසි104 | ------- | i. සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශයට අයත් වාහන 5 ක් අනතුරට ලක්ව තිබුණි. එම වාහන වලට සිදුවී ඇති සම්පූර්ණ අලාභය සහ ඊට වගකිවයුත්තන් කවුරුන්ද යන්න තීරණය කිරීමට අදාල පරීක්ෂණ සිදුකර නොතිබුණි. | පාඩුවක් හෝ අලාභ හානියක් සිදුවූ වහාම මුදල් රෙගුලාසි 104 (i) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී. |
| | | ii. නියෝජ්‍ය අමාත්‍ය කාර්යමණ්ඩලය සඳහා වෙන්කර තිබූ වාහනයක් 2017 දෙසැම්බර් 10 දින අනතුරට ලක්ව තිබුණද විගණන දිනය වූ 2019 මැයි 15 දින වන විටත් අදාල අලුත්වැඩියාව සිදුනොකර පෞද්ගලික ගරාජයක ගාල්කර ඇති බව අනාවරණය විය. මෙම අනතුරට අදාලව මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. | මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු නොකිරීම හේතුවෙන් රජයට යම් පාඩුවක් සිදුවුවහොත් එම පාඩුව ආවරණය කිරීම පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුය. | මෙම වාහනය කඩිනමින් අලුත්වැඩියා කිරීමට සහ අදාල රක්ෂණ හිමිකම ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. |
| (ආ)2014පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන **රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය** | | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක අන්තර්ගත විය යුතු කරුණු අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව සහ අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගත හැකි පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. | විධිමත් පරිදි සැලසුම් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
| --- | --- | --- |
| **ප්‍රතිපාදන ඌන උපයෝජනය**<br>ප්‍රාග්ධන වැය විෂයයන් 8 කට අදාලව වෙන් කරන ලද රු.13,000,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනය සහ වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කරන ලද එකතුව රු. 31,280,000 ක ප්‍රතිපාදනවලින් රු. 30,895,152 ක් හෙවත් සියයට 99 ක් ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වැය ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | කාර්යාල ගොඩනැගිල්ල වෙනත ස්ථානයකට ගෙනයාමේ කාර්යය ඉටු නොවීම සහ ආර්ථික වශයෙන් ඵලදායි නොවන යන්ත්‍ර උපකරණ වෙනුවෙන ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ජනනය නොවීම. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් වාර්ෂික කාර්යසාධන දර්ශකය තීරණය කිරීමේදී ප්‍රතිඵලය (Out come) සහ සමස්ත බලපෑම (Impact) ට අදාල කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. එසේම අරමුණු හා පරමාර්ථ පාදක කරගත් සංයුක්ත සැලැස්ම (Corporate plan) හෝ සමස්ත සැලැස්ම (Master plan) සකස් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට හැකිවන පරිදි දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන සැලසුම් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුව ඇත. | සමස්ත ආයතනික අරමුණු ඉටුකර ගැනීම ඉලක්ක කර ගනිමින් උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම සඳහා මේ වන විට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

-----------------------------------

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| --------------------- | ----------- | ------------------------------- |
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් එහි අරමුණ හා පරමාර්ථ ඉටුකර ගැනීමට සෘජු ලෙස බලපාන වැඩසටහන් 05 ක් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි. | තාත්වික පදනමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමට සහ එහි ඇතුලත් වැඩසටහන් නියමිත කාලය තුල ක්‍රියාත්මක කිරීමට හැකි වැඩපිළිවෙලක් සකස් විය යුතුව ඇත. | සැලසුම්කල වැඩ සටහන් ක්‍රියාත්මක කළ නොහැකි වීමට විවිධ හේතු ඉදිරිපත් කර තිබුණු අතර ඉදිරි වර්ෂවල ක්‍රියාකාරී සැලසුම්වලට මෙම වැඩසටහන්ද ඇතුලත් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. |
| (ආ) මැද පෙරදිග රටවල් 03 ක් සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම් නැවත සමාලෝචනය කිරීම හෝ යාවත්කාලීන කිරීමත්, රටවල් දෙකක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමත්, තවත් රටවල් 04 ක් සමඟ අත්සන් කර තිබූ ගිවිසුම් අනුව වාර්ෂිකව ඒකාබද්ධ කමිටු රැස්වීම් පැවැත්වීමත් 2018 වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබීමෙන් විදේශ රැකියා වෙළඳපොල හා සම්බන්ධ විවිධ රටවල් සමඟ රාජතාන්ත්‍රික මට්ටමින් සබඳතා පවත්වා ගැනීමට අවශ්‍ය කරන මැදිහත්වීම අමාත්‍යාංශය විසින් නිසි පරිදි සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | විදේශ රැකියා වෙළඳපොල හා සම්බන්ධ රටවල් සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම ක්ෂේත්‍රයට අදාලව පවතින ගැටලුවලට විසඳුම් ලබාගැනීමට පහසුවක් වන බැවින් ඒ පිළිබඳ කළමනාකරණයේ විශේෂ අවධානය යොමු විය යුතුව ඇත. | රාජතාන්ත්‍රික කටයුතු සඳහා සෘජු මැදිහත්වීමක් අමාත්‍යාංශයට සිදු කල නොහැකි අතර විදේශ කටයුතු අමාත්‍යාංශය/ තානාපති කාර්යාල සඳහා මේ සම්බන්ධයෙන් ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇති බව පවසා ඇත. |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

-----------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශ** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| --------------------- | --------- | -------------------------- |
| 2016 නොවැම්බර් 09 දිනැති අංක අමප/16/2048/741/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණ පත්‍රිකාව මගින් විගමණික ශ්‍රමිකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කිරීමට අනුමැතිය ලබාගෙන තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ක්‍රමය කෙටුම්පත් මට්ටමේ පැවතුණි. | මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුය. | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් අවසන් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව දන්වා තිබුණි. |

## 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

-----------------------------------------------------------------

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) විගමණික ශ්‍රමිකයන්ගේ පවුල් පැතිකඩවලට අදාල තොරතුරු පරිගණකගත කර දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට සහ යාවත්කාලීන කරන ලද තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට මාර්ගගත (Online) පරිගණක පද්ධතියක් මඟින් එවීම අරමුණු කරගෙන අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 2016 හා 2017 වර්ෂවල පරිගණක 277 ක් රු.35,500,959 ක් වැය කර මිලදීගෙන බෙදා හැර තිබුණි. එහෙත් අපේක්ෂිත පරිදි දත්ත පද්ධති නඩත්තු කර අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණ, නිම කලයුතු කාලය, මුළු පිරිවැය සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය ඇතුලත් සමස්ත සැලැස්මක් මත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය දායකත්වය මත දත්ත පද්ධතියක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවත් එම පද්ධතිය ක්‍රියාත්මක වන තෙක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තොරතුරු පවත්වාගෙන යන බවත් දන්වා තිබුණි. |
| (ආ) විදේශගත වූ ශ්‍රමිකයින් පිළිබඳ තොරතුරු කෙටි පණිවිඩ මාර්ගයෙන් සංවර්ධන නිලධාරීන්ට ලබාදීමේ ක්‍රමයක් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණද සමාලෝචිත වර්ෂය වන විට මෙම ක්‍රමය අඩාල වී තිබුණු බැවින් විගමණික පවුල් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතුවලට බාධාවක් වී තිබුණි. | ක්ෂේත්‍රය තුල රාජකාරි කටයුතු කරන සියලුම ආයතන හා පුද්ගලයන් අතර අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගත හැකි තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳ කළමනාකරණ අවධානය යොමු විය යුතුය. | මෙම වර්ෂයේ සැප්තැම්බර් මාසය තුල දත්ත පද්ධතියේ කටයුතු අවසන් කරන බව දන්වා ඇත. |

## 3.5 වෙනත් නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීයව සේවයේ යොදවන ලද සංවර්ධන නිලධාරීන් 914 දෙනාට අදාලව අනුයුක්ත කිරීමේ ගැටලු පැවතීම, රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සහ අධීක්ෂණය නිසි පරිදි නොලැබීම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ සම්බන්ධීකරණය දුර්වල තත්වයක පැවතීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් නිසි පරිදි නොපැවැත්වීම වැනි හේතූන් අනුව එම නිළධාරීන්ගෙන් අපේක්ෂිත කාර්යභාරය නිසි පරිදි ඉටුනොවන බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා මෙම නිළධාරීන්ගෙන් උපරිම දායකත්වය ලබාගත හැකි වැඩපිළිවෙළක් සකස්විය යුතු වීම. | මෙම නිළධාරීන් විධිමත් පරිදි අධීක්ෂණය කළහැකි වැඩ පිළිවෙළක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බව |

## 3.6 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ශ්‍රී ලංකාවේ විගමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල සුරක්ෂිතතාවය සහ සමෘද්ධිය කෙරෙහි දායකවීමේ අරමුණ ඇතිව ස්විට්සර්ලන්ත රජයෙන් පිළිවෙලින් පළමු හා දෙවන අදියරට ඇමරිකානු ඩොලර් 699,414 ක් සහ ඇමරිකානු ඩොලර් 3,875,000 ක අධාර මත 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ශ්‍රම විගමණ වැඩසටහන රාජ්‍ය නොවන සංවිධානයක් හරහා ක්‍රියාත්මක වී තිබුණි. එමෙන්ම ව්‍යාපෘති පිරිවැය, අරමුදල් දායකත්වය, වැඩසටහෙනහි අරමුණ හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ එකඟතාවයක් නොමැතිව 2020 වර්ෂය දක්වා ක්‍රියාත්මක වන එහි තෙවැනි අදියරය නියාමනය කිරීමේ බලය අමාත්‍යාංශය සතුව තිබුණද එම කටයුත්ත නිසිපරිදි සිදුනොකිරීම මත එහි මූල්‍ය හා මෙහෙයුම් කටයුතු රජයේ පාලනයකින් තොරව සිදු කෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය. | මෙම වැඩසටහන අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. | රාජ්‍ය ගිණුම්කාරක සභා නිර්දේශය මත මේ පිළිබඳ කැබිනට් මණ්ඩලය දැනුවත් කර ඇති අතර ඒ පිළිබඳ කරුණු සැලකිල්ලට ගන්නා බව අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් කර ඇති බව දන්වා තිබුණි. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 ජනවාරි 16 දිනැති අංක 2017/01 දරන විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛයේ 19 වන ජේදය ප්‍රකාරව පත්කරන ලද අභියාචනා කමිටුව නිසි සැලකිල්ලකින් යුතුව කටයුතු නොකිරීම නිසා රැකියාවක් සඳහා විදේශගතවූ කාන්තාවකගේ දරුවන් දැඩිලෙස ශාරීරිකව හා මානසිකව පීඩාවට පත්ව ඇති බව සහ දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටලුකාරී තත්ත්වයන් පැවති අවස්ථා 07 කදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නිර්දේශ නොසලකා පවුල් පසුබිම් වාර්තා නිකුත් කර තිබූ බව නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය විය. | දරුවන් සිටින කාන්තාවන් විදේශ රැකියා සඳහා පිටත්වීමට අනුමැතිය ලබාදීමේදී අදාල නිළධාරීන් වගකීමෙන් යුතුව කටයුතු කළ යුතුව ඇති අතර. මෙවැනි සිද්ධි නැවත ඇති නොවීම සඳහා නොසැලකිළිමත් කමින් කටයුතු කළ නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා නොමැති බව දන්වා තිබුණි. එමෙන්ම මෙවැනි අඩුපාඩු වලක්වා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙළක් අමාත්‍යාංශය විසින් සැලසුම් කර ඉදිරිපත් කර තිබුණි. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2018 මැයි 15 දින සිට විගණන දිනය වූ 2019 මැයි 08 දක්වා පුරප්පාඩුව පැවතුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් සුදුසු විගණකවරයකු පත් කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිළධාරියකු පත්කරන ලෙස ඉල්ලීම් කර ඇති බව සඳහන් කර තිබුණි. |
| (ආ) අභ්‍යන්තර විගණන ඒකකය වෙත වර්ෂය තුල ඉදිරිපත් වී තිබූ පැමිණිලි 30 කින් විගණිත දිනය වූ 2019 මැයි 10 වන විට පැමිණිලි 25 ක විමර්ෂණ කටයුතු | පැමිණිලි සඳහා නොපමාව විමර්ෂණ කටයුතු සිදුකල යුතු වීම. | විමර්ෂණ කටයුතු සඳහා පුහුණු නිළධාරීන් එම අංශයට අනුයුක්ත කිරීමට අවශ්‍ය කටයුතු |

| | | |
|---|---|---|
| සිදුකර නොතිබුණි. | | කරමින් පවතී. |

**05. මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------------------ |
| සමාලෝචිත වර්ෂය අවසානයට අමාත්‍යාංශයේ විධායක මට්ටමේ තනතුරු 11 කින් 04 ක් පුරප්පාඩුව පැවතුණි. එමෙන්ම සංවර්ධන සහකාර තනතුරු 06 ක් සඳහා කිසිදු නිළධාරියෙකු බඳවාගෙන නොතිබුණි. | මෙම තත්ත්වය අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට බාධාවක් බැවින් පවතින පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් පියවර ගතයුතු වීම. | තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව සහ සංවර්ධන සහකාර තනතුරු අනුමත කාර්යමණ්ඩලයෙන් ඉවත් කර ඒ සඳහා සංවර්ධන නිළධාරීන් සේවයේ යෙදවීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව |